ආයතනයේ නම : විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (119)

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කිරීම

රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඇගයීම - 2021 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290
ඇයතනයේ නම - විදුලිබල අමාත්‍යාංශය

<u>පළමු කොටස</u>

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබීම	රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල සේවා මුර ක්‍රමය යටතේ පැවැත්වීම හේතුවෙන් 2021 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොමැති වුවත් 2022, 2023 හා 2024 වර්ෂ සඳහා අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2021.12.15 දිනත් , 2023 ප්‍රසම්පාදන සැලැස්ම 2023.01.26 දිනත් 2024 ප්‍රසම්පාදන සැලැස්ම 2023.12.12 දිනත් අනුමත කර අදාල අංශ වෙත යවා ඇත.
02	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
03	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද වී තිබූ 2021 හා 2022 යන වර්ෂයන්ට අදාල වාර්ෂික වාහන ධාවන සටහන් පොත් 2023 ජනවාරි මස රජයේ විගණන අංශය වෙත යොමු කර ඇති අතර 2023 මැයි මස සිට විදුලිබල අමාත්‍යාංශයේ සියළුම සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් පත්‍ර හා මාසික සාරාංශ සටහන් පත්‍ර සෑම මසක් අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරනු ලබයි.

04	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2023 ඔක්තෝම්බර් මස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විදුලිබල අංශයේ සියළුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සඳහා කටයුතු කර ඇත.
05	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතන සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	චක්‍රලේඛයේ 3.2 යටතේ ඉන්ධන පරීක්ෂාව කළ යුත්තේ සංචිත වාහන 100km ක් හෝ ඊට වඩා ධාවනය කළ යුතු රාජකාරී ගමනක් යෙදෙන අවස්ථාවකදීය. 2021 වර්ෂයේ රට තුල පැවති කොරෝනා වසංගතය හා වරින් වර පැනවූ ඇඳිරි නීති තත්වයන් හේතුවෙන් එවැනි දුර ප්‍රමාණයක රාජකාරී කටයුතු අමාත්‍යාංශයේ නොතිබූ බැවින් 3.2 පරිදි ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැත.

දෙවන කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට මේ දක්වා පුරවැසිසේවාලාභී/ප්‍රඥප්තිය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර එය අමාත්‍යාංශ වෙබ් අඩවියේ ද පළ කර ඒ අනුව ක්‍රියාත්මක වීමට සියලු නිලධාරීන්ද දැනුවත් කර ඇත.
02	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට මේ දක්වා අමාත්‍යාංශයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අංශ භාර මාණ්ඩලික නිලධාරීන් අධීක්ෂණය කරනු ලබයි.
03	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇති අතර ඒ අනුව කෘර්ය සාධන ඇගයීම් සිදුකරන අතර මානව සම්පත් සැලැස්ම වසර දෙකකදී යාවත්කාලීන කල යුතු බැවින් ඒ සඳහා කටයුතු සිදුකරමින් පවතී.

04	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2021 වර්ෂයේ රට තුල පැවති කොරෝනා වසංගතය හා එරින් වර පැනවූ ඇදිරි නීති තත්වයන් හමුවේ කාර්යාල සම්පූර්ණයෙන් විවෘත කර නොතිබීම හා නිලධාරීන් අඛණ්ඩව සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එමෙන්ම 2022 හා 2023 වර්ෂය සඳහා පුහුණු ආයතන මගින් සංවිධානය කරන වැඩසටහන් වලට නිලධාරින්ව සහභාගී කරවීම ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුණි. කෙසේ වෙතත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සිටින අත්දැකීම් බහුල පරිණත නිලධාරින් කිහිපදෙනෙකුගේ අත්දැකීම් හා දැනුම බෙදාහරිමින් ඔවුන්ගේ සම්පත් දායකත්වයෙන්, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන් වෙනින් අවශ්‍ය පුහුණු අවශ්‍යතා පිළිබඳව විමසීම් කර පැය 12ක අවම පුහුණුවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.
05	සමස්ථ කාර්යමණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් යකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2023 වර්ෂයේදී සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කොට ඇත. ඉදිරියේදී වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව රා.ප.ව.02/2018 (I) මගින් දන්වා ඇත.
06	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේදී කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සහ කාර්යාල සම්පූර්ණයෙන් විවෘත කර නොතිබුණු බැවින් පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් ලෙස නොපැවැත්වීම මත අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන්ට සැලැසුම්ගත පුහුණු අවස්ථා ලබා දීමට නොහැකි වී ඇත. එමෙන්ම 2022 හා 2023 වර්ෂය සඳහා පුහුණු ආයතන මගින් සංවිධානය කරන වැඩසටහන් වලට නිලධාරින්ව සහභාගී කරවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුණි. කෙසේ වෙතත් උක්ත 04 කරුණට ලබාදී ඇති පැහැදිලි කිරීමට අදාලව සියළුම අංශ නියෝජනය වන පරිදි පත්වීම් ස්වරූප, පරිවාස කාලය තුළ කටයුතු කළ යුතු ආකාරය, විශ්‍රාම ගැන්වීම, ලිපිගොනුකරණය, ගිණුම් කටයුතු, සැලසුම් කටයුතු යනාදිය සම්බන්ධව පැය 02 බැගින් පුහුණු පාඨමාලා 07ක් පැවැත්වූ අතර එමගින් පැය 14ක් ආවරණය වන පරිදි පුහුණු පාඨමාලා සාර්ථකව පවත්වන ලදී. ඒ අනුව 2023 වසර තුළ පුහුණු පාඨමාලා සම්බන්ධ සැලසුම්ගත ඉලක්කය 100% සපුරා ඇත. දෛනික කාර්යාල කටයුතු සඳහා මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අවශ්‍ය වන දැනුම ලබාගැනීමට අවශ්‍ය සෑම නිලධාරියෙක්ටම මේ සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙන ලදි.

ආචාර්ය සුලක්ෂන ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ආ
ලේක
විදුලි
අංක
කොළ

යවර්ධන

ාත්‍යාංශය
සිල්වා මාවත,

රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290
ආයතනයේ නම - බලශක්ති අමාත්‍යාංශය

<u>පළමු කොටස</u>

අනු අංකය	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	චක්‍රලේඛයේ 3.2 යටතේ ඉන්ධන පරීක්ෂාව කළ යුත්තේ සංචිත වාහන 100km ක් හෝ ඊට වඩා ධාවනය කල යුතු රාජකාරී ගමනක් යෙදෙන අවස්ථාවකදීය. එවැනි දුර ප්‍රමාණයන් රාජකාරී කටයුතු අමාත්‍යාංශයේ නොතිබූ බැවින් 3.2 පරිදි ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැත. විදේශ විනිමය හිඟයක් හා ඉන්ධන සඳහා අධික වැය බරක් දැරීමට සිදුවන මෙවැනි අවස්ථාවක ඉන්ධන පරීක්ෂාව සඳහාම 100km ක් හෝ ඊට වැඩිදුරක් ධාවනය කිරීම ආර්ථික වශයෙන් යෝග්‍ය නොවේ.
02	මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි.	වර්තමානයේ මෙවැනි බැදීම් ඇති කර ගෙන නොමැත.
03	වර්ෂ එකකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ පැවතීම.	වර්ෂයකට වැඩි එක් ණය ශේෂයක් පමණක් පැවති අතර එය මේ වන විට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් යොමුකරන ලද 2023.03.02 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති අනුමැතිය පරිදි මෙම හිඟහිටි ණය ශේෂය පොන්වලින් කපා හැරීමට කටයුතු කර ඇත. (ඇමුණුම 01)

දෙවන කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබා දුන් නියෝගයන්	අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශය ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය කමිටුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	වර්තමානයේ සකසා ඇති මානව සම්පත් සැලැස්ම මඟින් අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය ආවරණය කර පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත.
02	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා සම්පූර්ණ කර ඇත. නමුත් 2023.11.30 දින හා අංක 02/2018(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය අනුව 2024 වර්ෂයේ සිට ඉදිරියට ගිවිසුම් අත්සන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වා ඇත.
03	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අමාත්‍යාංශයේ ඇතුම් නිලධාරීන් පුහුණු කිරීම සඳහා පසුගිය කාලයේදී අයවැය ප්‍රතිපාදන ලබා දී නොතිබුණි.එබැවින්, මෙම අමාත්‍යාංශයේ සිටින අත්දැකීම් බහුල මාණ්ඩලික නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලැබෙන පරිදි වැඩසටහනක් පැවැත්විණි.
04	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව වර්තමාන විගණන මතය වේ.
05	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් විගණන ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ මේ වන විට නිවැරදි කර ඇති අතර ඉදිරියේ දී මෙවැනි දෝෂ ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. තවද, ඒ පිළිබඳ නිරන්තර පසු විපරම් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
06	සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයෙ සිට මේ දක්වා අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 24 දෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇත.

ආචාර්ය සුලක්ෂන ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක 80, ශ්‍රීමත් ඇර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 7.

රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව
அரச நிதித் திணைக்களம்
DEPARTMENT OF PUBLIC FINANCE

මහ භාණ්ඩාගාරය
திறைசேரி
The Secretary, Ministry of Finance, Economic Stabilization and National Policies

මහ භාණ්ඩාගාරය
திறைசேரி
General Treasury

Tel: 94-11-7484614
Fax: 94-11-7484655
Email: dpf@treasury.gov.lk

Tel: 94-11-2484637
Fax: 94-11-7451459

Website: www.treasury.gov.lk

මගේ අංකය
எமது இல.
My No. PFD/REDAWO/2023/06

ඔබේ අංකය
உமது இல.
Your No. RDA/3/2/49

දිනය
திகதி
Date 2023.03.62

ලේකම්
විද්‍යුත් බල සැපයුම් අමාත්‍යාංශය

රජයේ නිලධාරීන්ගේ අක්තිකාරම් හි ශේෂය ලියාපදිංචි කිරීම සඳහා නිවාසය ප්‍රශ්න පු. රෙ.113 යටතේ අත්හැරීම පුදානය කිරීම

ඉහත කරුණු සම්බන්ධයෙන් මෙයට සමාංකනය කර 2023.02.16 දිනැති ලිපියෙහි ඇඳේ.

02. යොමුත ලිපිය මඟින්, බැවිල් තෙල් සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරු සිරකව සිටි සේවය ෆෑල්ලෙස් දැනි එච්.පී.ඉන්ද්‍රලාල් මහතාගෙන් අයකර ගැනීමට නොහැකිව ඇති ණය ශේෂය අත්හැර දැමීම සඳහා වයස්, සේවා කාර්යක්ෂමතා සුසිකව ඉල්ලීමක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

03. ඒ අනුව, එම නිලධාරියාට අයත් රු.67,884.00ක නිවාස ණය ශේෂය පු.රෙ.113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා භාණ්ඩාගාර නිර්දේශ ලේකම් අනුමැතිය පිණිස ඉදිරිපත් කරමි.

අලෙක්ස්.
4ක ඒ (සජිත මල)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විගණන)
ග නගරාධිපති
ඉ —
03/09

ජේ.සී. වලිසේරා
රාජ්‍ය මූල්‍ය අධීක්ෂක ජනරාල්

පිටපත්:
1. විශේෂාධිපතිවරියගේ පිළිගැනීම කාර්යාලය
2. අධ්‍යක්ෂ ජනරාල්, ණය අයකැමි දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, රජය ගිණුම් දෙපාර්තමේන්තුව

කරුණාවෙලා
නිවාස ණය
ලියාපදිංචි
ඉල්ලීම
03/2023
Ms. D

රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290
ආයතනයේ නම - සූර්යබල, සුලං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

<u>පළමු කොටස</u>

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව නිකුත් කළ මාර්ගෝපදේශ වල නියමිත දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂයේ සමහර මාස වල සිගාස් මාසික ගිණුම් සාරාංශ ප්‍රමාද වී ඇත. කෙසේ නමුත් 2021 වර්ෂයේ මාස කිහිපයක මාසික ගිණුම් සාරාංශ නියමිත දිනට පෙර ඉදිරිපත් වී ඇති බව නිරීක්ෂණය වේ.
02	ලැබෙන වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සූර්යබල, සුලං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කිරීමෙන් පසුව ඊට අදාල ලේඛන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත භාර දී ඇත.
03	බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	රාජ්‍ය අමාත්‍යාංශය බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කිරීමෙන් පසු ඊට අදාල ලේඛන, පොත්පත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත 2023.09.04 දින භාර දී ඇත.
04	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අමාත්‍යාංශය හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ නමුත් රාජ්‍ය අමාත්‍යාංශයේ භාවිතයට ලබා දී තිබූ රජයේ වාහන සම්බන්ධයෙන් 2021 වර්ෂයේ හානි සිදු වී නොමැති බවද වෙනත් වත්කමක හානියක් සිදුවී නොමැති බවද වාර්තා වේ.
05	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කිරීම සඳහා වන අවශ්‍යතාවය රාජ්‍ය අමාත්‍යාංශය අනුගමනය කර නොතිබුණි.

06	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	එකඟ වෙමි. පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල සේවා මුර ක්‍රමය මත විවෘතව තැබීම නිසා රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණයවේ.
07	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	එකඟ වෙමි. පැවති කොවිඩ් වසංගත තත්වය මත කාර්යාල සේවා මුර ක්‍රමය මත විවෘතව තැබීම නිසා රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණයවේ .
08	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇතත් මසක් තුළ පිළිතුරු ලබා දීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.
09	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු සපයා ඇතත් මසක් තුළ පිළිතුරු ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ.
10	1018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල් පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයන් සිදු කලත් අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ.
11	මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ.
12	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි නොමැති බව නිරීක්ෂණය වේ.
13	2017.05.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාරයාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු 09 දින පිහිටුවා ඇති අතර 2021 හා 2022 වර්ෂය තුලදී මිලදී ගත් වත්කම් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර ඇත.
14	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා	එකඟවෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් අදාල චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.

	කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	
15	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. නමුත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වීමෙන් පසුව භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2023.09.13 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත සියළු වත්කම් පවරා දී ඇත.
16	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය විසින් එසේ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ නමුත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වීමෙන් පසු සිදුකල භාණ්ඩ සමීක්ෂණයේ රජයේ වත්කම් වල අතිරික්තයක් හෝ ඌනතාවයක් නොමැති බව තහවුරු විය.
17	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති 2021 වර්ෂයට අදාල ලිපිගොනු අනුව වාහන ලොග් පොත් යාවත්කාලීන කර තිබූ බව නිරීක්ෂණය වේ. පැවති රාජ්‍ය අමාත්‍යාංශ විසින් 2021 වර්ෂයට අදාල වාහන ලොග් පොත් යාවත්කාලීන කර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත භාර දී ඇත.
18	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන උපලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	චක්‍රලේඛයේ 3.2 යටතේ ඉන්ධන පරීක්ෂාව කළ යුත්තේ සංචිත වාහන 100km ක් හෝ ඊට වඩා ධාවනය කල යුතු රාජකාරී ගමනක් යෙදෙන අවස්ථාවකදීය. 2021 වර්ෂයේ රට තුල පැවති කොරෝනා වසංගතය හා වරින් වර පැනවූ ඇදිරි නීති තත්වයන් හේතුවෙන් එවැනි දුර ප්‍රමාණයක රාජකාරී කටයුතු අමාත්‍යාංශයේ නොතිබූ බැවින් 3.2 පරිදි ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැති බව නිරීක්ෂණය වේ.
19	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය එසේ කටයුතු කර නොතිබුණි. නමුත් 2023 වර්ෂයේ දී සංශෝධිත මුදල් පොතක් සකස් කර අනාවරණය වූ ගැලපුම් සිදුකර ඇත.
20	මු.රෙ 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	එකහවෙමි. රාජ්‍ය අමාත්‍යාංශය අනුමත සීමාව ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබූ බව නිරීක්ෂණ වේ.
21	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	නිලධාරීන් දෙදෙනෙකුට අයත් ණය ශේෂයන් පැවති අතර 2022 මැයි ගිණුම් සාරාංශ මහින් එක් නිලධාරියකුගේ ණය ශේෂය නිරවුල් වී ඇති අතර අනෙක් නිලධාරියාගේ ණය ශේෂය මෙතෙක් අයකර ගැනීමට හැකිවී නැත. කෙසේ නමුත් ඒ සඳහා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

22	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කොට නොතිබුණි.	2021 වර්ෂයේ දී රාජ්‍ය අමාත්‍යාංශය විසින් විධිමත්ව මුදල් පොත යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් මුදල් පොතේ වෙනසක් නිබී ඇත. එය නිවැරදි කිරීමට සංශෝධිත මුදල් පොතක් පිළියෙල කර අග්‍රිම ගිණුම භාණ්ඩාගාරය සමඟ සැසඳුම් කිරීමෙන් පසුව 2023 වර්ෂයේ දී අග්‍රිම ගිණුම පියවා ඇත.
23	අනුමත අග්‍රිම ගිණුම් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් අග්‍රිම සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නැත. නමුත් 2023 වර්ෂයේ භාණ්ඩාගාර අග්‍රිම ගිණුම සසඳා පියවා ඇත.
24	අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශය විසින් මුදල් පොත නිවැරදිව යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් පැවති ගැටළුකාරී තත්ත්වය විසඳීම සඳහා සංශෝධිත මුදල් පොතක් පිළියෙල කරන ලදී. ඒ අනුව අග්‍රිම ගිණුමේ හඳුනාගත් වෙනස්කම් නිවැරදි කිරීමටත් අදාල නිවැරදි කිරීම් වලින් පසු රාජ්‍ය අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුම 2024.01.18 දින මුදල් අමාත්‍යාංශය විසින් වසා දමා ඇත.
25	කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	2021 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර තිබුණි.
26	2017.09.20 දිනැති 2017 අංක 04 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	2021 වර්ෂයේ කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසානයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

<u>දෙවැනි කොටස</u>

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	එකඟ වෙමි. මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබූ බැවින් එම අවස්ථාවේ වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට නොහැකි වී ඇත.
02	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	එකඟ වෙමි. වෙබ් අඩවියක් පවත්වාගෙන ගොස් නොමැති බැවින් එසේ කටයුතු කිරීමට නොහැකි වී ඇත.
03	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	කොවිඩ් වසංගතය සමග කාර්යාල සේවා මුර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ බැවින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට හැකිව නොතිබුණි
04	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	එකඟ වෙමි. කොවිඩ් වසංගතය සමග කාර්යාල සේවා මුර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ බැවින් පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශව විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ බව නිරීක්ෂණයවේ.
05	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය වේ.
06	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2021 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල පැමිණීම සේවා මුර ක්‍රමයකට අවම වශයෙන් සිදුවීම නිසා පුහුණු අවස්ථා ලබාදීමට නොහැකි වී ඇත.
07	සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොමැති බව නිරීක්ෂණය වේ.

08	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	එකඟ වෙමි. 2021 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල පැමිණීම සේවා මුර ක්‍රමයකට අවම වශයෙන් සිදුවීම නිසා රාජ්‍ය අමාත්‍යාංශය තුල ඒ සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර නොතිබුණි.
09	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල පැමිණීම සේවා මුර ක්‍රමයකට අවම වශයෙන් සිදුවීම නිසා පුහුණු අවස්ථා ලබාදීමට නොහැකි වී ඇත.
10	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	පිළිගනිමි.
11	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	එකඟ වෙමි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනා ගෙන නොතිබූ බව නිරීක්ෂණයවේ.
12	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය එසේ කටයුතු කර නොතිබූ අතර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ කිරීමත් සමඟ හඳුනා ගන්නා ලද මෙම තත්වය නිවැරදි කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ නිර්දේශ මත බැංකු සැසඳුම් ප්‍රකාශය සහ අග්‍රිම ගිණුම හා සම්බන්ධව පැවති ගැටළුකාරී තත්වය නිවැරදි කර ඇත. එසේම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමග ඒකාබද්ධ වීමත් සමග ණය අත්තිකාරම් ගිණුම හා පොදුකැන්පත් ගිණුමට අදාල ලේඛන වැටුප් ලේඛන (P ලෙජර්), ඉන්වෙන්ට්‍රි ලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය ආදීය යාවත්කාලීන කර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත පවරා දී ඇත.
13	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	සියළුම මාණ්ඩලික නිලධාරීන්ගේ වත්කම් ප්‍රකාශ එවකට විදුලිබල අමාත්‍යාංශය වෙත භාරගෙන සුරක්ෂිතව ඇත.
14	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර ඇත.

ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක 80, ශ්‍රීමත් ඇර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 7.